# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 13,272 — 1962 අගෝස්තු 24 වැනි සිකුරාද — 1962.8.24

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඩ කරන ලදි)

# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සැම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ආදිය ... ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය ... | 1227 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | 1227 |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | 1228 |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... ... | 1229 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... ... | 1230 |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 1231 |
| මිළ පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහා බැංකුවේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 1233 |
| "සුරාබදු ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය

**1962 අංක 346**

අංකය : ඩී/වීඑජ්/42.

### යුධ හමුදාව—ලංකා ස්වේච්ඡා භට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද ද්විතීයනය කිරීමක්

1962 ජූලි මස 18 වැනි දින සිට යුද්ධ හමුදාවේ ස්වේච්ඡා භට සේනාවේ පහත නම් සඳහන් නිලධාරියා, නිත්‍ය හමුදාවේ සේවය සඳහා අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් ද්විතීයනය කරන ලදී :—

ලුතිනන් කර්නල් මාවතගේ ඩන්ස්ටන් වයිටස් මැඩොන්සා, ල. ජා. ආ. බ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. කියු. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1962 අගෝස්තු 17 වෙනිදා,
කොළඹ දීය.

8-906

---

**1962 අංක 347**

අංකය : ඩී. 23/රෙක් ව/77.

### රාජකීය ලංකා ගුවන් හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම් සඳහන් නිලධාරියා 1962 සැප්තැම්බර් 30 වැනි දින සිට විශ්‍රාම ගනී :—

බලපංති ලුතිනන් ඩබ්ලිව්. ජේ. මේ (01056), පරිපාලන/අධ්‍යාපන.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන් කියු. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1962 අගෝස්තු 11 වෙනිදා,
කොළඹ දීය.

8-813

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

**1962 අංක 348**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පහත සඳහන් පත් කිරීම් කරන ලෙස නියමකර ඇත්තේ ය :—

ඒ. 213/62.

1962 ජූලි මස 14 වැනි දින සිට ඇටෝර්නි ජනරාල් දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් ඒ. සී. අලස් මහතා සොලිසිටර් ජනරාල් වශයෙන්.

ඒ. 186/62.

1961 නොවැම්බර් මස 21 වැනි දින සිට ඩී. ආර්. උමගිලිය මහතා කම්කරු දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කම්කරු කොමසාරිස් වශයෙන්.

ඒ. 120/62.

1962 ජූලි මස 2 වැනි දින සිට සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ සහකාර කොමසාරිස් ආර්. සමරසේකර මහතා එම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස් වශයෙන්.

1962 ජූලි මස 2 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සිවිල් සේවක සී. ආර්. ද සිල්වා මහතා සමුපකාර සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් ලෙස වැඩ බැලීමට.

එන්. පී. විජයරත්න,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 අගෝස්තු මස 20 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.
තැ. පෙ. 500.

8-961

අංකය : පීඑල්/එච්. 1/48.

ටී. එල්. ජේ. හඩ්ජි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ ඩබ්ලිව්. ඒ. ඉමැනුවෙල් මහතා 1962 අගෝස්තු 13 වැනි දින, කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැළඹිලි හත්පත්තුවේ සහ හිරියාල හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/එච්. 5/56.

පී. එම්. සෙනෙවිරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, සී. බී. ද සිල්වා මහතා 1962 අගෝස්තු 16 වැනි දින සිට 18 වැනි දින දක්වා අනුරාධපුර දිස්ත්‍රික්කයේ උතුරු සහ දකුණු නුරුඑ පළාත්වල ගම්බද උසාවි සභාපති ධුරයේ හා කලාගම් පළාතේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/පී. 7/56.

ටී. බී. වැත්තැව මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එම්. ඒ. ඊ. බී. පෙරේරා මහතා 1962 අගෝස්තු 15 වැනි දින සිට 18 වැනි දින දක්වා, කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ හා වන්නි හත්පත්තුවේ, කටුගම්පොල හත්පත්තුවේ සහ හිරියාල හත්පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඒ. 8/61.

ඒ. අලගයියා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එන්. එස්. සිවප්‍රගාසම් මහතා 1962 අගෝස්තු 27 වැනි දින සිට 1962 සැප්තැම්බර් 1 වැනි දින දක්වා, මඩකලපුව දිස්ත්‍රික්කයේ කාරවකු, නින්තාවූර්, සමන්තුරේ හා වැවුගම් පත්තු ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඊ. 1/48.

එම්. එහෙම්පර නාදන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, පී. කුමාරනායගම් මහතා 1962 සැප්තැම්බර් 10 වැනි, 11 වැනි, 13 වැනි, 14 වැනි, 17 වැනි, 18 වැනි, 20 වැනි, 21 වැනි, 24 වැනි, 25 වැනි දිනයන්හි හා 27 වැනි දින සිට 29 වැනි දින දක්වා, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කඩ්ඩුකුලම් හා තම්පලකාමම් පත්තුවල ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/ආර්. 4/50.

එස්. ටී. රාජරත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එන්. එහෙම්පරම් මහතා 1962 අගෝස්තු 17 වැනි හා 18 වැනි දිනයන්හි, යාපන දිස්ත්‍රික්කයේ දූපත් හා බටහිර වලිකාමම් ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/පී. 1/48.

ආර්. පරමකුරු මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, පී. ආර්. රාජේන්ද්‍රා මහතා 1962 අගෝස්තු 27 වැනි හා 28 වැනි දිනයන්හි, යාපනේ හා පෙදුරුතුඩුව දිස්ත්‍රික්කවල, උතුරු හා නැගෙනහිර වලිකාමම්, වඩමරච්චි හා යාපනේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

ඇන්. ඒ. ද ඇස්. විජේසේකර,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 අගෝස්තු 17 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංකය-573,
කොළඹ-12.

8-864

## වෙනත් පත් කිරීම් ආදිය

1962 අංක 350

(20 වැනි පරිච්ඡේදය වන) ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින් :—

අංකය : අයිඑන්කත්‍ර/එල් 3/3/62.

1962 අගෝස්තු මස 7 වැනි දින සිට බී. ඒ. ප්‍රේමවංශ මහතා නැවත වැඩ භාරගන්නා තුරු මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස් පත්තු මැදසිය පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩ බැලීමට එච්. බී. කුලතුංග මහතා ද,

අංකය : අයිඑන්කත්‍ර/එල් 3/4/62.

1962 අගෝස්තු මස 6 වැනි දින සිට යූ. බී. පෙතියාගොඩ මහතා නැවත වැඩ භාරගන්නා තුරු මහනුවර දිස්ත්‍රික්කයේ ගමට පළාත කෝරළේ හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩබැලීමට සී. බී. මඩවල මහතා ද,

අංකය : අයිඑන්කත්‍ර/එල් 8/1/58.

1962 අගෝස්තු මස 3 වැනි දින සිට එස්. ධර්මබන්දු මහතා නැවත වැඩ භාරගන්නා තුරු හම්බන්තොට දිස්ත්‍රික්කයේ බටහිර ගිරුවා පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩ බැලීමට විල්මට් ගුණරත්න මහතා ද,

අංකය : අයිඑන්කත්‍ර/එල් 9/2/57.

1962 ජූලි මස 19 වැනි දින සිට කේ. රාමනාතන් මහතා නැවත වැඩ භාරගන්නා තුරු යාපනේ දිස්ත්‍රික්කයේ කයිට්ස්හි, වෙල්ලච් කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩ බැලීමට ඊ. යතවරායර් මහතා ද,

අංකය : අයිඑන්කත්‍ර/එල් 11/2/57.

1962 ජූලි මස 29 වැනි දින සිට කේ. මීරා මොහිදීන් මහතා නැවත වැඩ භාරගන්නා තුරු මන්නාරම් දිස්ත්‍රික්කයේ විදත්තල්තිව් කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩ බැලීමට එස්. පොන්නුසියා මහතා ද,

අංකය : අයිඑන්කත්‍ර/එල් 11/1/59.

1962 ජූලි මස 28 වැනි දින සිට කේ. කේ. එස්. හබීබ් මොහොමඩ් මහතා නැවත වැඩ භාරගන්නා තුරු මන්නාරම් දිස්ත්‍රික්කයේ ඉරුක්කුලම්පිද්දි කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩ බැලීමට කේ. කේ. මාපිලයි මරික්කාර් මහතා ද,

අංකය : අයිඑන්කත්‍ර/එල් 11/1/60.

1962 අගෝස්තු මස 4 වැනි දින සිට එස්. එස්. රාජදුරෙයි මහතා නැවත වැඩ භාරගන්නා තුරු මන්නාරම් දිස්ත්‍රික්කයේ පලෙයිකුලි අඩංපන් ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩ බැලීමට ඒ. ප්‍රනාන්දු මහතා ද,

අංකය : අයිඑන්කත්‍ර/එල් 14/1/60.

1962 අගෝස්තු මස 4 වැනි දින සිට ඩී. ඒ. ලංකාතිලක මහතා නැවත වැඩ භාරගන්නා තුරු කුරුණෑගල දිස්ත්‍රික්කයේ මයුරාවතී කෝරළේ හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩ බැලීමට පී. බී. මැදගොඩ මහතා ද,

අංකය : අයිඑන්කත්‍ර/එල් 18/2/62.

1962 අගෝස්තු මස 3 වැනි දින සිට එච්. එච්. ඇන්. සිල්වා මහතා නැවත වැඩ භාරගන්නා තුරු බදුලු දිස්ත්‍රික්කයේ යටිපලාත කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩ බැලීමට ආර්. බී. මුල්ලේගම මහතා ද,

අංකය : අයිඑන්කත්‍ර/එල් 18/5/57.

1962 අගෝස්තු මස 1 වැනි දින සිට පී. බී. රත්නායක මහතා නැවත වැඩ භාරගන්නා තුරු බදුලු දිස්ත්‍රික්කයේ සොරනාතොට ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩබැලීමට කේ. පී. ඇස්. විජේතුංග මහතා ද,

අංකය : අයිඑන්කත්‍ර/එල් 21/1/62.

1962 අගෝස්තු මස 6 වැනි දින සිට බී. ඒ. ජේ. කාසිනාඩර් මහතා නැවත වැඩ භාරගන්නා තුරු අම්පාරේ දිස්ත්‍රික්කයේ පනමාපත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩබැලීමට පී. එල්. පැට්‍රික් මහතා ද,

අංකය : අයිඑන්කත්‍ර/එල් 21/2./62.

1962 ජූලි මස 30 වැනි දින සිට කේ. නල්ලෙයිනාදන් මහතා නැවත වැඩ භාරගන්නා තුරු අම්පාරේ දිස්ත්‍රික්කයේ සම්මන්තුරේ කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩබැලීමට කේ. සෝමසුන්දරම් මහතා ද,

අංකය : ඒඅයි 6/3/61.

1962 අගෝස්තු මස 9 වැනි දින සිට ගාලු දිස්ත්‍රික්කයේ බෝපේ ගම්කාර්යශී සභා ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක වරයෙකු වශයෙන් එස්. ටී. එච්. ද සිල්වා මහතා ද,

අංකය : ඒඅයි 8/2/62.

1962 ජූලි මස 18 වැනි දින සිට අළුත් පත්වීමක් කරන තුරු හම්බන්තොට දිස්ත්‍රික්කයේ බටහිර ගිරුවා පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩබැලීමට ඇස්. ධර්මබන්දු මහතා ද,

අංකය : ඒඅයි 10/2/62.

1962 ජූලි මස 19 වැනි දින සිට ස්ථිර පත්කිරීමක් කරන තුරු වවුනියා දිස්ත්‍රික්කයේ කිල්ලකමූලායි දකුණ කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩබැලීමට ඇස්. පත්මනාතන් මහතා ද,

අංකය : ඒ අයි 21/1/61.

1962 අගෝස්තු මස 9 වැනි දින සිට මොනරාගල දිස්ත්‍රික්කයේ බුත්තල වැදිරට කෝරළේ හදිසි මරණ පරීක්ෂක වරයකු වශයෙන් එස්. ඩබ්ලිව්. කුමාරසිංහ මහතා ද, පත් කර ඇත්තේ ය.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන,
ස්ථිර ලේකම්.

1962 අගෝස්තු මස 17 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

8-981

---

1962 අංක 351

## ගැසට් නිවේදනයයි

අංකය : ඒ. එම්. 20/1/56.

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ ගරු අධිකරණ අමාත්‍යවරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව එතුමා විසින් :—

(1) එම්. එම්. සුල්තාන් මහතා යාපනේ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් සහ නිල නොලත් මහෙස්ත්‍රාත් වරයෙකු වශයෙන් ද,

(2) වී. ආර්. සච්චිතානන්දන් මහතා ත්‍රිකුණාමලේ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

(3) ඊ. ආර්. ඒ. හේවාවිතාරණ මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

(4) බී. ඒ. හෙන්රි ද සිල්වා මහතා පොලොන්නරුව අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද, පත් කර ඇත්තේ ය.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන,
ස්ථිර ලේකම්.

1962 අගෝස්තු මස 20 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

8-980

---

1962 අංක 352

අංකය : ඩී. 32/රෙක් ව.

## රාජකීය ලංකා නාවික හමුදාවේ නිලධාරීන් ස්ථිර කිරීම්

පහත සඳහන් නිලධාරියා 1962 අගෝස්තු 1 වැනි දින සිට උප ලුතිනන් පදවියේ ස්ථිර කරන ලදී :—

වැඩබලන උප ලුතිනන් ඇල්. ආර්. රාජසිංහම්—රාජකීය ලංකා නාවික හමුදාව.

ඇන්. කපු. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1962 අගෝස්තු 16 වෙනිදා,
කොළඹ දීය.

8-905

---

1962 අංක 353

අංකය : ඩී. 2/රෙක් ව/20.

## රාජකීය ලංකා නාවික හමුදවේ නිලධාරීන්ගේ උසස් කිරීම්

1962 ජූලි මස 1 වැනි දින සිට මිඩ්ෂිප්මන් වරුන් වශයෙන් :—

ශිෂ්‍ය භට ඒ. ඇම්. ඒ. පී. අභයවර්ධන

ශිෂ්‍ය භට ඇම්. ඇස්. සිරිවර්ධන

ශිෂ්‍ය භට සී. ඩී. ජයකොඩි

ශිෂ්‍ය භට අයි. ඇම්. තිලකරත්න

ශිෂ්‍ය භට පී. අම්බලවානර්

ශිෂ්‍ය භට ඒ. විජයතිලක

ශිෂ්‍ය භට ඇන්. ජී. ඒ. ප්‍රනාන්දු

1962 ජූලි මස 1 වැනි දින සිට මිඩ්ෂිප්මන් (ඊ) වරුන් වශයෙන් :—

ශිෂ්‍ය භට (ඊ) එච්. එල්. එල්. එම්. කරුණාරත්න

ශිෂ්‍ය භට (ඊ) ඇප්. එච්. ජේ. පෙරේරා.

ඇන්. කපු. දියෙස්.
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1962 අගෝස්තු 11 වෙනිදා, කොළඹ දීය.

8-819

---

1962 අංක 354

ලංකා සිවිල් සේවාවේ පහත සඳහන් පත්වීම් පහත දක්වා ඇති දිනවල පටන් වලංගුවේ :—

අංක : 74/2/37 (ඇම් ඇෆ්).

ඇස්. ඇස්. සිල්වා මහතා 1962 අගෝස්තු මස 2 වැනි දින සිට මහා භාණ්ඩාගාරයේ සහකාර ආයතන පාලකයකු වශයෙන් වැඩ බැලීමට.

අංක : 74/2/55 (ඇම් ඇෆ්).

අයි. එම්. ජී. ඒ. ඊරියගොල්ල මහතා 1962 අගෝස්තු මස 1 වැනි දින සිට සහකාර ඉඩම් කොමසාරිස් වශයෙන් වැඩ බැලීමට.

අංක : 74/2/210 (ඇම් ඇෆ්).

ඒ. ඊ. ගොගර්ලි මොරගොඩ මහතා 1962 ජූලි මස 16 වැනි දින සිට භාණ්ඩාගාරයට අනුයුක්තව සිටීමට.

අංක : 74/2/229 (ඇම් ඇෆ්).

බී. එච්. ද සොයිසා මහතා 1962 අගෝස්තු මස 1 වැනි දින සිට කම්කරු හා ජනසතු සේවා අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයන් වැඩ බැලීමට.

අංක : 74/48 (ඇම් ඇෆ්).

ඩී. ජී. පී. සෙනෙවිරත්න මහතා 1962 අගෝස්තු මස 1 වැනි දින සිට බදුල්ල කචේරියට අනුයුත්තව සිටීමට.

පී. ඒ. ටී. ගුණසිංහ මහතා 1962 අගෝස්තු මස 1 වැනි දින සිට කොළඹ කච්චේරියට අනුයුක්තව සිටීමට.

ඇස්. ඇම්. ඇල්. මරික්කාර් මහතා 1962 අගෝස්තු මස 1 වැනි දින සිට මහනුවර කච්චේරියට අනුයුක්තව සිටීමට.

ඇස්. ඇල්. බී. අමුණුගම මහතා 1962 අගෝස්තු මස 1 වැනි දින සිට කළුතර කච්චේරියට අනුයුක්තව සිටීමට.

හ. ෂ. අමරසිංහ,
භාණ්ඩාගාරයේ ලේකම්.

1962 අගෝස්තු මස 20 වැනි දින,
මුදල් අමාත්‍යාංශය,
කොළඹ.

8-978

---

# රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය

1962 අංක 355

මෙහි පහත සඳහන් පත් කිරීම 1962. 8. 1 දින සිට ක්‍රියාත්මක වන ලෙස මවිසින් නියම කර ඇත.

"සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකරු පන්තියේ දෙවැනි ශ්‍රේණියේ ලිපිකරු ටී. පරරාජසිංහම් මහතා පේදුරුතුඩුවේ කාර්යාලයේ සේවය කරමින් යාපනය පාලන දිස්ත්‍රික්කයෙහි අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර් කෙනෙකු වශයෙන්."

ඒ. එම්. එස්. පෙරේරා,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

1962 ජූලි මස 19 වැනි දින,
කොළඹ, රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේදී ය.

8-784

## ආණ්ඩුවේ නිවේදන

අ. ආ. කා. අංකය : ජේ. 83/47 (2),

සී.බී.ඊ. නාමධාරී, ගරු ටී. ඇස්. ප්‍රනාන්දු විනිශ්චයකාරතුමන්ට දී තිබෙන නිවාඩු කාල පරිච්ඡේදය තුළ, අග්‍රාණ්ඩුකාරතුමන් විසින්, 1946 යේ හා 1947 තේ ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජාඥාවල 53 වැනි වගන්තිය යටතේ, 1962 අගෝස්තු 26 වැනි දින සිට, අධිකරණ සේවා කොමිෂන් සභාවේ තාවකාලික සාමාජිකයකු වශයෙන් ගරු තම්බයියා විනිශ්චයකාරතුමන් පත් කළ බව, මෙයින් දැනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

සී. ජ. වල්පිට,
අග්‍රාණ්ඩුකාරතුමාගේ වැඩබලන ලේකම්.

1962 අගෝස්තු 16 වැනි දින,
මහනුවර, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයේ දී.

8-824

---

ඇල්.ඩී.—බී 60/52.

### තානායම් පනත

(275 පරිච්ඡේදය) දරන තානායම් පනතෙහි 3 වෙනි වගන්තිය යටතේ අගමැති සහ රාජ්‍යආරක්ෂක හා විදේශ කටයුතු භාර ඇමති විසින් පනවනු ලබන ආඥාවයි.

සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක,
අගමැති සහ රාජ්‍යආරක්ෂක හා විදේශ කටයුතු භාර ඇමති.

1962. 8. 16,
කොළඹ 1.

#### ආඥාව

1962 අගෝස්තු මස 18 වෙනි දින පටන් ක්‍රියාත්මක වන පරිදි, මෙහි උපලේඛනයේ I වෙනි තීරයෙහි නියමිත එක් එක් තානායමේ පාලනය, ඒ උපලේඛනයේ II වෙනි තීරයෙහි අනුරූප සටහනෙහි නියමිත සුදුසු බලධරයා වෙත මෙයින් මාරු කරනු ලැබ, ඒ බලධරයා කෙරෙහි පවරනු ලැබිය යුතුය.

#### උපලේඛනය

| I වෙනි තීරය<br>තානායම | II වෙනි තීරය<br>සුදුසු බලධරයා |
|---|---|
| හිඟුරක්ගොඩ තානායම | පොළොන්නරු පාලන දිස්ත්‍රික්කයේ දිසාපති. |
| හඟුරන්කෙත තානායම | නුවරඑළි පාලන දිස්ත්‍රික්කයේ දිසාපති. |
| කල්කුඩා තානායම | මඩකලපු පාලන දිස්ත්‍රික්කයේ දිසාපති. |

8-814/1

---

ඇල්.ඩී.—බී. 60/52.

### තානායම් පනත

(275 පරිච්ඡේදය) දරන තානායම් පනතෙහි 3 වෙනි වගන්තිය යටතේ අගමැති සහ රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු භාර ඇමති විසින් පනවනු ලබන ආඥාවයි.

සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක,
අගමැති සහ රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු භාර ඇමති.

1962. 8. 16,
කොළඹ 1.

#### ආඥාව

1962 අගෝස්තු මස 18 වෙනි දින පටන් ක්‍රියාත්මක වන පරිදි, මෙහි උපලේඛනයේ I වෙනි තීරයෙහි නියමිත එක් එක් තානායමේ පාලනය, ඒ උපලේඛනයේ II වෙනි තීරයෙහි අනුරූප සටහනෙහි නියමිත සුදුසු බලධරයා වෙත මෙයින් මාරු කරනු ලැබ ඒ බලධරයා කෙරෙහි පවරනු ලැබිය යුතුය.

#### උපලේඛනය

| I වෙනි තීරය<br>තානායම | II වෙනි තීරය<br>සුදුසු බලධරයා. |
|---|---|
| නුවර වැව තානායම | අධ්‍යක්ෂ, රජයේ දේශ සංචාරක කාර්‍යාංශය. |
| තිසාවැව තානායම | අධ්‍යක්ෂ, රජයේ දේශ සංචාරක කාර්‍යාංශය. |

8-814/2

### 1961 අංක 32 දරණ අනුරාධපුර සංරක්ෂණ මණ්ඩල පනත.

1961 අංක 32 දරණ අනුරාධපුර සංරක්ෂණ මණ්ඩල පනතෙහි 3 වැනි ඡේදයට අනුව අනුරාධපුරයේ වැඩබලන ආණ්ඩුවේ දිසාපති, සිවිල් නිලධාරී, ඩබ්ලිව්. ඒ. ගුණරත්න මහතා, අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ සාමාජිකයෙක් සහ එම මණ්ඩලයේ සභාපති වශයෙන් 1962 අගෝස්තු 1 දින සිට, ගරු අගමැති තුමිය විසින් පත්කරන ලදී.

ඇන්. ක්‍යූ. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 අගෝස්තු 17,
කොළඹ 1.

8-816

---

ඇල්. ඩී.—බී. 130/46.

අංකය : 4/3/131/ජීසී.
දේ. ආ. කො.-ඕ. ආර්.ඩී. 87.

### ආදායම් බදු ආඥාපනත

#### 46 (1) වැනි වගන්තිය යටතේ නිවේදනය

(242 අධිකාරය වන) ආදායම් බදු ආඥා පනතේ 46 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් ඇමති නැන්පත් ෆීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, මෙහි උප ලේඛනයේ සඳහන් පොදු පුණ්‍යාධාර භාරය එකී වගන්තියේ කාර්යයන් සඳහා පිළිගත් පුණ්‍යායතනයක් හැටියට මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
මුදල් ඇමති.

1962 අගෝස්තු මස 13 වැනි දින,
කොළඹදීය.

#### උපලේඛනය

බණ්ඩාරනායක අනුස්මරණ වාට්ටු අරමුදල

8-768

---

### මුද්දර ආඥාපනත

#### 2 වෙනි වගන්තිය යටතේ කරනු ලබන ආඥාව

වර්ෂ 1959 අංක 21 දරන පනතින් සංශෝධිත මුද්දර ආඥා පනතේ (247 අධිකාරය) 2 වෙනි වගන්තියේ (2) වෙනි උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් ඇමති ෆීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, ලංකාණ්ඩුව විසින් හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් හෝ ලංකාණ්ඩුවේ නමින් ලියා අත්සන් කරනු ලබන යම් නිශ්චල දේපළක් බදු දීමට අදාළ වන යම් නීත්‍යානුකූල ලේඛනයක් සම්බන්ධයෙන් බෙල්ජියමෙහි කිසිම මුද්දර ගාස්තුවක් අය කළ නොහැකි යයි සැහීමට පත්ව ඉහත කී වගන්තියේ (11) වෙනි ඡේදයෙන් හෝ (1) වෙනි උප වගන්තියේ අතුරු විධානයෙන් දෙන ලද නිදහස් කිරීම, වර්ෂ 1962 අගෝස්තු මස 25 වෙනි දිනයෙහි සිට බෙල්ජියමේ ආණ්ඩුව විසින් හෝ වෙනුවෙන් හෝ නමින් ලියා අත්සන් කරනු ලබන එවැනි යම් නීත්‍යානුකූල ලේඛනයකට අදාළ විය යුතු යයි ප්‍රකාශයට පත් කරමි.

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
මුදල් ඇමති.

1962 අගෝස්තු මස 14 වෙනි දින,
කොළඹ දීය.

8-974

---

අංකය : 543 ඊ 969/5 සීසී.

මෙහි පහත නියමිත තනතුරු දරන්නන් 1962.4.1 දින සිට විශ්‍රාම වැටුප් වලට හිමිකම් ඇත්තන් බව, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 2 වෙනි වගන්තිය ප්‍රකාර මෙයින් දන්වනු ලැබේ :—

ආණ්ඩුවේ මුද්‍රණාලය

ෆෝර්මන් වරු

හ. ෂ. අමරසිංහ,
භාණ්ඩාගාරයේ ලේකම්.

1962 අගෝස්තු 15 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේදීය.

8-811

## ගම්බද අධිකරණ ආඥාපනත

ජේ/ආර්සී/34/51 (1).

අම්පාරේ දිස්ත්‍රික්කයේ වැව්ගම් පත්තු ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශය තුළ උහන පිහිටි, උතුරට (අම්පාරේ දිස්ත්‍රික්කයේ) ආණ්ඩුවේ දිසාපති වෙත දනට පවරා ඇති ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ ගොඩනැගිලිවලින් ද, දකුණට සුළු පාරෙන් හා (අම්පාරේ දිස්ත්‍රික්කයේ) ආණ්ඩුවේ දිසාපති වෙත දනට පවරා ඇති ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ ගොඩනැගිලිවලින් ද, නැගෙනහිරට (අම්පාරේ දිස්ත්‍රික්කයේ) ආණ්ඩුවේ දිසාපති වෙත දනට පවරා ඇති ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ ගොඩනැගිලිවලින් ද, බස්නාහිරට සුළු පාරෙන් හා උහන කච්චේරියේ මායිම් වැටෙන් ද මායිම් වූ කම්කරු සමාජශාලා ගොඩනැගිල්ල යනුවෙන් හැඳින්වෙන ගොඩනැගිල්ල උහන ගම්බද අධිකරණ ශාලාව වශයෙන් පාවිච්චි කිරීම සඳහා (8 වෙනි අධිකාරය වන) ගම්බද අධිකරණ ආඥාපනතෙහි 19(2) වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ ඇමතිතුමා විසින් වෙන්කර තිබෙන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන,
වැඩබලන ස්ථිර ලේකම්,
අධිකරණ අමාත්‍යාංශය.

1962 අගෝස්තු මස 11 වෙනි දින,
කොළඹ අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

8-789

---

## හඟුරන්කෙත ඇසළ පෙරහැර

### නිවේදනය

1951 අප්‍රේල් 6 වැනි දින අංක 10,232 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිඬ කරන ලද හඟුරන්කෙත ඇසළ පෙරහැරට අදාළ වන්දනා නියෝග පිළිබඳව නියෝගවල 1 වැනි සහ 2 වැනි නියෝගවලින් මට පැවරී ඇති බලතල අනුව, කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමැති තැන්පත් මෛත්‍රීපාල සේනානායක වන මම, මෙම නිවේදනයෙන්—

(1) ඉහත කී නියෝගවල 1 වැනි නියෝගය යටතේ 1962 වර්ෂය තුළදී ඉහත කී නියෝග බල පවත්වන කාලය, 1962 අගෝස්තු මස 30 වැනි දින පටන් 1962 සැප්තැම්බර් මස 15 වැනි දින අවසන්වන කාලය බව නියම කරමි.

(2) තවද, ඉහත කී නියෝගවල 2 වැනි නියෝගය යටතේ පහත දැක්වෙන උපලේඛනයෙහි නියමිත ප්‍රදේශය, 1962 වර්ෂය තුළදී ඉහත කී නියෝග අදාල කිරීම පිණිස කඳවුරු ප්‍රදේශය විය යුතු ලෙස නියම කරමි.

මෛත්‍රීපාල සේනානායක,
කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික
කටයුතු පිළිබඳ ඇමති.

1962 අගෝස්තු මස 21 වැනි දින,
කොළඹදීය.

### උපලේඛනය

#### කඳවුරු ප්‍රදේශය

පහත සඳහන් මායිම් ඇතුළත පිහිටි, උඩහේවාහැට කොට්ඨාශයේ දියතිලක කෝරලයේ හඟුරන්කෙත ගම්මුළාදෑනි කොට්ඨාශයට අයත් හඟුරන්කෙත පිහිටා ඇති සියලුම භූමි ප්‍රදේශය :—

උතුරට: පිලපිටිය කඳුර සිට මහනුවර-රාගල ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ පාරට වැටෙන අඩිපාර, මහනුවර-රාගල ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ පාර සහ ආර් ඊ. එස්. ද සොයිසා මහතාගේ ඉඩමේ උතුරු මායිම; නැගෙනහිරට: එළ මල්වැව කඳුර; දකුණට: පැව්රෝල් ගබඩාවේ සිට ලංකා දුම්කොළ සමාගමේ භූමියට වැටෙන පාර සහ ලංකා දුම්කොල සමාගමේ භූමියෙහි සිට බොරහින්න පාරට වැටෙන අඩිපාර; සහ බස්නාහිරට: පැල්-ලිඳ පොල්වත්තේ නැගෙනහිර මායිම, කුඹුරේ ගෙදර වත්තේ නැගෙනහිර මායිම, වැව්ලියැද්ද කුඹුරේ නැගෙනහිර මායිම, බෝදන්ඩරාවේ කුඹුරේ නැගෙනහිර මායිම, නවන්එළිය කුඹුරේ නැගෙනහිර මායිම සහ පිලපිටිය කුඹුරේ නැගෙනහිර මායිම.

8-1009

ඇල්ඞී.—බී. 60/52.

## නානායම් පනත

(275 පරිච්ඡේදය) දරන නානායම් පනතෙහි 3 වෙනි වගන්තිය යටතේ කර්මාන්ත, සවදේශ සහ සංස්කෘතික කටයුතු භාර ඇමතිතුමා විසින් පනවනු ලබන ආඥාවයි.

මෛත්‍රීපාල සේනානායක,
කර්මාන්ත, සවදේශ සහ සංස්කෘතික
කටයුතු භාර ඇමති.

1962 අගෝස්තු මස 21 දින,
කොළඹ 7.

### ආඥාව

1962 සැප්තැම්බර් මස 1 වෙනි දින පටන් ක්‍රියාත්මක වන පරිදි, මෙහි උපලේඛනයේ I වෙනි තීරුයෙහි නියමිත එක් එක් නානායමේ පාලනය, ඒ උපලේඛනයේ II වෙනි තීරයෙහි අනුරූප සටහනෙහි නියමිත සුදුසු බලධරයා වෙත මෙයින් මාරු කරනු ලැබ, ඒ බලධරයා කෙරෙහි පවරනු ලැබිය යුතුය.

### උපලේඛනය

| I වෙනි තීරය | II වෙනි තීරය |
|---|---|
| නානායම. | සුදුසු බලධරයා |
| හංවැල්ල නානායම | අධ්‍යක්ෂ, රජයේ දේශ සංචාරක කාර්යාංශය. |

8-1008

---

1951 අංක 13 දරණ මුස්ලිම් විවාහ හා දික්කසාද ආඥාපණතේ 12 (1) වැනි වගන්තිය යටතේ කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් මොණරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවායේ කොට්ඨාශයේ බුත්තල කෝරළයට අයත් කතරගම යන ග්‍රාමයත් සිතුත්තරාම පළාත කෝරළයට අයත් කරවිලගම හා දෙටගමුව යන ග්‍රාමයනුත් හැර බදුල්ල-හල්දුම්මුල්ල අධිකරණ කොට්ඨාශයට පත්කරන ලද ක්වාසිවර වැලිමඩ පදිංචි මිස්කින් බාවා කාදර් මීරා සයිබු මොහිදීන් ෂහුල් හමීඩ් මහතා එකී ක්වාසි ධුරයෙන් 1962 අගෝස්තු මස 1 වැනි දින සිට ඉල්ලා අස්වූ බව මෙයින් දන්වමි.

වී. එල්. වීරසිංහ,
කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 අගෝස්තු මස 7 වැනි දින,
කොළඹ දී ය.

8-920

---

## 1957තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන පනත

### 21 ඒ (1) වෙනි වගන්තිය යටතේ කරන නියෝගයයි

කම්කරුවන් හා ජනසතු සේවාවන් පිළිබඳ අමාත්‍ය ධුරන්ධර මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, මට කලින් සිටි ඇමතිතුමකු විසින් 1957තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන පණතේ 20 (1) වෙනි වගන්තිය යටතේ කරන ලදින් 1959 පෙබරවාරි මස 28 වෙනිදා 11,687 වෙනි අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළවූ නියෝගය, මේ සමග ඇති උපලේඛනයෙහි දක්වා ඇති එක් එක් දේපළට සම්බන්ධවන තරමින්, 1961කේ 22 වෙනි අංකය දරණ පණතෙන් සංශෝධිත 1957තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන පණතේ 21ඒ (1) වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පිට මේ නියෝගයෙන්, 1962 සැප්තැම්බර් මස 1වෙනි දා සිට, අවලංගු කරමි.

ඇම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරුවන් හා ජනසතු සේවාවන් පිළිබඳ
අමාත්‍ය තැන.

1962 අගෝස්තු මස 17 වෙනි දින,
කොළඹ දීය.

### උපලේඛනය

| දේපළවල් | පිහිටීම හා සෙසු විස්තර |
|---|---|
| 1. සීමාසහිත ජැෆ්ජනා සෙන්ට්‍රල් බස්රථ සමාගම විසින් පාවිච්චි කරන ලද දේපල. ප්‍රමාණයෙන් පර්චස් 20ක් පමණ වූ කව්වුතරෙයි නමැති ඉඩමෙන් කොටසක් සහ එහි පිහිටි සියලු ගොඩනැගිලි. | යාපන දිස්ත්‍රික්කයේ මල්ලාකම් නම් ගමේ උතුරට: අරුපිල්ලෙයි කුට්ටි තම්බිගේ දේපළය; නැගෙනහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටසය; දකුණට: මෙම ඉඩමේ ඉතිරි කොටසය; බස්නාහිරට: ප්‍රධාන පාරය යන මේ මායිම් ඇතුළත පිහිටා තිබේ. |

| | |
|---|---|
| **2. සීමාසහිත නෝර්ත් වෙස්ටන් බ්ලූ ලයින් ඔම්නි බස්රථ සමාගම විසින් පාවිච්චි කරන ලද සහ පාවිච්චි කිරීමට බලාපොරොත්තු වූ දේපළ.** | |
| ප්‍රමාණයෙන් අක්කර 1, රූඩ් 1ක් පමණ වූ පැලවත්ත නැමති ඉඩම සහ එම ඉඩමේ පිහිටි ගොඩනැගිලි ; | මීගමුවේ නාගරික සභා ප්‍රදේශ සීමාවතුල උතුරට : ජේ. ඇම්. ප්‍රනාන්දු මහතාගේ සහ සෙස්සන්ගේ දේපල සහ බී. බී. ෂොක්මන්ගේ සහ කේ. ඇස්. එච්. ප්‍රනාන්දුගේ දේපළය ; නැගෙනහිරට : ඩබ්ලිව්. ඇම්. මූනසිංහගේ දේපළය ; දකුණට : නාගරික සභාවේ ක්‍රීඩා භූමිය සහ ඞී. සී. ඇම්. පෙරේරාට සහ කේ. එල්. ප්‍රනාන්දුට අයිති දේපළය ; බස්නාහිරට : ප්‍රධාන පාරය යන මේ මායිම් ඇතුළත පිහිටා තිබේ. |

8-884

## 1957තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන පනත

### 21 (4) වෙනි වගන්තිය යටතේ කරන නියෝගය

කම්කරුවන් හා ජනසතු සේවාවන් පිළිබඳ අමාත්‍ය ධුරන්ධර මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1961 කේ 22 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන (සංශෝධන) පණතෙන් සංශෝධිත 1957තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන පණතේ 21 වෙනි වගන්තියේ (4) වෙනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පිට, මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි විස්තර දක්වා ඇති නිශ්චල දේපළවල අත්කරගැනීම 1962 සැප්තැම්බර් මස 1 වෙනි දා සිට මේ නියෝගයෙන් අහෝසි කරමි.

ඇම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරුවන් හා ජනසතු සේවාවන් පිළිබඳ
අමාත්‍ය තැන.

1962 අගෝස්තු මස 16 වෙනි දින,
කොළඹ දීය.

### උපලේඛනය

| දේපළ | පිහිටීම හා සෙසු විස්තර |
|---|---|
| **1. සීමාසහිත ග්‍රීන්ලයින් ඔම්නි බස්රථ සමාගම විසින් පාවිච්චි කරන ලද් දේපළ.** | |
| (නමක් නැති) ඉඩම හා එහි පිහිටි සියලු ගොඩනැගිලි. | අනුරාධපුර නගරයේ කුරුණෑගල වීදියේ උතුරට හා නැගෙනහිරට : ඒ. සිවකොලන්දුට අයිති ඉඩමද ; දකුණට : නැසීගිය වී. මයිල්වගනම්ගේ උරුමක්කාරයින්ට අයිති ඉඩමද ; බස්නාහිරට : මහ පාරද, යන මේ මායිම් තුල පිහිටි, 126 වෙනි වරිපනම් අංකය දරණ ස්ථානය. |

8-912

## පඩිපාලක සභා ආඥපනත

1962 මැයි මස 17 වැනි දින සිට අවුරුදු 3ක කාලයක් තුළ ඉංජිනේරු කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයන් හැටියට පෙනී සිටීමට පඩිපාලක සභා ආඥපනතේ (136 වැනි පරිච්ඡෙදය) 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු හා ජනසතු සේවා පිළිබඳ ඇමතිතුමන් විසින්, පහත නම් සඳහන් තැනැත්තන් පත් කරන ලද බව 1943 පඩිපාලක සභා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

වී. ඇස්. ඇම්. ද මෙල්,
ස්ථිර ලේකම්වරයා,
කම්කරු හා ජනසතු සේවා අමාත්‍යාංශය.

1962 අගෝස්තු මස 15 වන දින,
කොළඹදීය.

### නම නියමකොට පත්කරන ලද සාමාජිකයෝ

වී. සිවප්‍රකාස පිල්ලෙ මහතා
ඇල්. එච්. සුමනදාස මහතා
සී. සූරියකුමාරන් මහතා

### සේව්‍ය නියෝජිතයෝ

ඇම්. එච්. ආර්. ඇස්ට්බරි මහතා
ඊ. ජේ. වෙන්හැම් මහතා
ඞී. පී. එබනට් මහතා
ඞී. බී. ද ඇස්. ගුණසේකර මහතා
වී. ටී. සෙල්ලදොරේ මහතා
ඞී. සී. ආර්. ගුණවර්ධන මහතා
අයන් ඊ. අමරසිංහ මහතා
අර්ඩ්ලි ද සිල්වා මහතා
ජේ. වීරකෝන් මහතා

### සේවක නියෝජිතයෝ

ඇන්. සන්මුගදාසන් මහතා
එච්. පී. ආරියදාස මහතා
ජී. පී. පෙරේරා මහතා
ඇස්. ඒ. ඩබ්ලිව්. සිල්වා මහතා
තිලක කුලසේකර මහතා
ජේ. ඒ. ආරච්චි අප්පු මහතා
එච්. සී. වෙඩිවර්ධන මහතා
ඒ. ඩබ්ලිව්. අන්ද්‍රයස් අප්පුහාමි මහතා
ආර්. ආර්. ජේම්ස් ප්‍රනාන්දු මහතා

8-877

## සෞඛ්‍ය සේවා පණත

### රත්නපුර ආරෝග්‍යශාලා මණ්ඩලය

(219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පණතේ 11 වෙනි වගන්තිය යටතේ 1962 අගෝස්තු මස 15 වෙනි දින පටන් 1962 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා එන්. ඉලංගකෝන් මහතා රත්නපුර ආරෝග්‍යශාලා මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් ගරු සෞඛ්‍ය ඇමති තුමා විසින් පත් කරනු ලැබූහ.

එල්. එස්. බී. පෙරේරා,
ස්ථිර ලේකම්.

1962 අගෝස්තු මස 15 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේදීය.

8-919

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## 1938 අංක 51 දරණ සමාගම් ආඥා පනත

### 277 (3) වගන්තිය යටතේ සීමාසහිත ඕස්ට්‍රියා සිලෝන් ට්රේඩිං සමාගමේ නම කපා හැරීමේ දැන්වීම

1938 අංක 51 දරණ සමාගම් ආඥපනතේ විධි විධාන යටතේ 1953 අප්‍රේල් 23 දින සංස්ථාපිත සමාගමක් වන සීමාසහිත ඕස්ට්‍රියා සිලෝන් ට්රේඩිං සමාගම ව්‍යාපාරික කටයුතුවල නිරතු වී නැති බව නැත හොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නො කිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, සීමාසහිත ඕස්ට්‍රියා සිලෝන් ට්රේඩිං සමාගමේ නම, මෙම කාර්යාලයේ තිබෙන් සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, වෙළඳ සමාගම් රෙජිස්ත්‍රාර් තැන්පත් වෝල්ටර් මහේස සෙල්ලයියා වන මම, 1938 අංක 51 දරණ සමාගම් ආඥපනතේ 277 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩබ්ලිව්. ඇම්. සෙල්ලයියා,
වෙළඳ සමාගම් රෙජිස්ත්‍රාර්.

1962 අගෝස්තු මස 16 වන දින,
කොළඹ, වෙළඳ සමාගම් රෙජිස්ත්‍රාර්ගේ දෙපාර්තමේන්තුවේදීය.

8-805

ඇල්.ඞී.—බී. 23/50.

## උකස් පනත

වාණිජ අධ්‍යක්ෂ, හිනිගේ රිචර්ඩ් වෝල්ටර් ද සිල්වා වන මම (89 අධිකාරය වන) උකස් පනතේ අංක 3 (ඇ) සහ 114(2) දරන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මහජන බැංකුව, ඒම පනතේ කාර්යයන් සඳහා පිළිගත් ණයදෙන ව්‍යාපාරයක් වශයෙන්, මෙම නිවේදනයෙන් ප්‍රකාශයට පමුණුවා සිටිමි.

ජී. ආර්. ඩබ්ලිව්. ද සිල්වා,
වාණිජ අධ්‍යක්ෂ.

1962 අගෝස්තු මස 13 වෙනි දින,
කොළඹදී ය.

8-764

ඇල්.ඩී—බී. 23/50.

## උකස් පනත

වාණිජ අධ්‍යක්ෂ, ගිනිගේ රිචර්ඩ් වෝල්ටර් ද සිල්වා වන මම (89 අධිකාරය වන) උකස් පනතේ අංක 3 (ඈ) සහ 114(2) දරන වගන්ති වලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සීමාසහිත මහජන පිදිනැන්ස් සමාගම, එම පනතේ කාර්යයන් සඳහා පිළිගත් ණයදෙන ව්‍යාපාරයක් වශයෙන් මෙම නිවේදනයෙන් ප්‍රකාශයට පමුණුවා සිටිමි.

ජී. ආර්. ඩබ්ලිව්. ද සිල්වා,
වාණිජ අධ්‍යක්‍ෂ.

1962 අගෝස්තු මස 13 වෙනි දින,
කොළඹදී ය.

8-762

---

## දැන්වීමයි

දුර්ලභ වෘක්‍ෂලතා හා වන සත්ව ආරක්‍ෂක පනතේ 325 වැනි පරිච්ඡේදයේ 6 වැනි රෙගුලාසිය යටතේ රුහුණු ජාතික උයන් භූමි 1962 සැප්තැම්බර් මස 1 වැනිදා සිට 30 වැනිදා දක්වා වසා තබන බව මෙයින් දන්වා සිටිමි.

ඒ. ඇස්. ඒ. පකීර්,
වැ/බ. භාරකාර තැන.

වනසත්වාරක්‍ෂක දෙපාර්තමේන්තුව,
කොළඹ 1,
1962. 8. 15.

8-829

---

## ප්‍රකාශනය

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ නුගගහ ගෙදර ගම "මුව සහ කුර" වසංගත ඇති පළාතක් ලෙස තහනම් කරමින් අංක 13,241 හා 62. 8. 3 දිනැති ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරන ලද ප්‍රකාශණයෙහි ප්‍රකාශිත දිනය 1962 ජූලි 5 වෙනුවට 1962 ජූලි 25 දිනය යෙදී සංශෝධනය විය යුතු බව මෙයින් දන්වමි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරී.

1962 අගෝස්තු 17 දින,
පේරාදෙනියේ රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරි තැනගේ කාර්යාලයේ දීය.

8-904

---

## ප්‍රකාශනයයි

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහ ගල්බොඩ එගොඩ කෝරළයේ තඹගල්ල සහ කිරිදිවෙල්මඩ ගම්වල ගවයන් අතර "මුව සහ කුර" නමැති රෝගය පැතිරී යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් අබේරත්න බණ්ඩාරනායක වන මම, 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥපනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි :—

උතුරට : අනුරාධපුර දිස්ත්‍රික්කයේ හිරියාල හත්පත්තුව සහ කලගම් පළාත අතර මායිම් ; දකුණට : කුරුණෑගල දිස්ත්‍රික්කයේ හිරියාල හත්පත්තුව සහ වැඋඩ විල්ලි හත්පත්තුව අතර මායිම් ; නැගෙනහිරට : මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ දකුණ සහ හිරියාල හත්පත්තුව සහ මාතලේ උතුර අතර මායිම් ; බස්නාහිරට : කුරුණෑගල දිස්ත්‍රික්කයේ වන්නි හත්පත්තුව, හිරියාල හත්පත්තුව සහ වැඋඩ විල්ලි හත්පත්තුව අතර මායිම්.

2. මෙම ආඥපනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනා ලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්තකරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර ඉබ්බාගමුව පශු වෛද්‍ය තැනගෙන් හෝ හිරියාල හත්පත්තුව කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කායසීලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩි දුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු වන බව දත යුතු සි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1962 අගෝස්තු 11 වැනි දින,
පේරාදෙනියේ රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරි තැනගේ කායසීලයේ දී ය.

8-755

---

## ප්‍රකාශනයයි

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මැදගොඩ ය[illegible] කොට්ඨාශයේ මැදගොඩ ගමේ ගවයන් අතර "මුව සහ කුර" නමැති රෝගය පැතිරී යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නි[illegible] තැන්පත් අබේරත්න බණ්ඩාරනායක වන මම, 1957 [illegible] සංචාරක (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෙ[illegible] 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැ[illegible] යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත ස[illegible] පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් [illegible] ලබන බව මෙයින් ප්‍රකාශ කරමි :—

උතුරට : දිගන්ඇදණිය ; දකුණට : වලිකුඹුර ; නැගෙනහිරට : තඹලස්ස සහ රම්මුතුගල ; බස්නාහිරට : පනාවිටිය සහ රත්නාහැරුව.

2. මෙම ආඥපනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනා ලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර පොල්ගහවෙල පශු වෛද්‍ය තැනගෙන් හෝ දඹදෙණිය හත්පත්තුව කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කායසීලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩි දුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු වන බව දත යුතු සි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1962 අගෝස්තු 11 වැනි දින,
පේරාදෙනියේ රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරි තැනගේ කායසීලයේ දී ය.

8-756

---

## ප්‍රකාශනයයි

බටහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ දූනගහ ගම්පති කොට්ඨාශයේ ගවයන් අතර "මුව සහ කුර" නමැති රෝගය පැතිරී යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරී තැන්පත් අබේරත්න බණ්ඩාරනායක වන මම, 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥ පනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති දේශයක් කොට සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි :—

උතුරට : ආකරගම ; දකුණට : අළුතපොළ ; නැගෙනහිරට : කපුවල සහ හුනුමුල්ල ; බස්නාහිරට : කඩවල.

2. මෙම ආඥ පනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනා ලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර මීගමුවේ පශු වෛද්‍ය තැනගෙන්

හෝ අළුත්කුරු කෝරළේ උතුර—බී කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩි දුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වළංගු වන බව දත යුතු සි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1962 අගෝස්තු 15 වැනි දින,
පේරාදෙනියේ රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරි තැනගේ කාර්යාලයේදී ය.

8-807/1

## ප්‍රකාශනයයි

බටහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලියපිටිය ගම්පති කොට්ඨාශයේ ගවයන් අතර "මුව සහ කුර" නමැති රෝගය පැතිරී යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් අබේරත්න බණ්ඩාරනායක වන මම, 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥා පනතේ 327 වැනි [illegible]දයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ [illegible] බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි [illegible] රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන [illegible] කරමි.

8-884

1957ගේ [illegible]හෙල් ඇල්ල; දකුණට: හපුවලාන; නැගෙනහිරට: [illegible] ඇල්ල; බස්නාහිරට: දූනගහ.

2. මෙම ආඥා පනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනා ලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පිළිබඳ නිති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නිති රීති සම්බන්ධව වැඩි විස්තර මීගමුවේ පශු වෛද්‍ය තැනගෙන් හෝ අළුත්කුරු කෝරළේ උතුර—බී කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩි දුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වළංගු වන බව දත යුතු සි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1962 අගෝස්තු 15 වැනි දින,
පේරාදෙනියේ රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරි තැනගේ කාර්යාලයේදී ය.

8-807/2

## ප්‍රකාශනයයි

බටහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කන්දවෙල ගම්පති කොට්ඨාශයේ ගවයන් අතර "මුව සහ කුර" නමැති රෝගය පැතිරී යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් අබේරත්න බණ්ඩාරනායක වන මම, 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥා පනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි:—

උතුරට: දෙමං හන්දිය; දකුණට: අත්ගල; නැගෙනහිරට: බටහිර කටාන; බස්නාහිරට: කලුවාරිප්පුව.

2. මෙම ආඥා පනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනා ලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පිළිබඳ නිති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නිති රීති සම්බන්ධව වැඩි විස්තර මීගමුවේ පශු වෛද්‍ය තැනගෙන් හෝ අළුත්කුරු කෝරළේ උතුර කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩි දුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වළංගු වන බව දත යුතු සි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1962 අගෝස්තු 15 වැනි දින,
පේරාදෙනියේ රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරි තැනගේ කාර්යාලයේදී ය.

8-807/3

## රථ වාහන වලට අවහිර

### උතුරු මැද කොට්ඨාශය—අනුරාධපුර දිස්ත්‍රික්කය

### අනුරාධපුරය-කුරුණෑගල පාරේ 19 වෙනි සැතපුමේ කලාඔය පැන්නුම් පාලම වැඩි දියුණු කිරීම

අනුරාධපුර-කුරුණෑගල පාරේ 19 වෙනි සැතපුමේ කලාඔය පැන්නුම් පාලම අළුත්වැඩියා කිරීම සඳහා, 62.9.1 වෙනි දින් සිට මාස 2 (දෙකක) කාලයක් දක්වා එය සියළුම රථ වාහන උදෙසා වසා තබනු ලැබේ.

2. මේ හැරුණු විට ඇති අනිකුත් මාර්ග පහත දැක්වේ:—

(අ) කුරුණෑගල-දඹුල්ල-මරදන්කඩවල-අනුරාධපුරය පාර.
(ආ) මාහෝ-නිකවැරටිය-පුත්තලම-අනුරාධපුරය පාර.

එච්. කේ. මෙල්සන් ප්‍රනාන්දු,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

රජයේ වැඩ කාර්යාලය,
කොළඹ 1,
1962 අගෝස්තු 15 වෙනි දින.

8-809

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

### රථ වාහනයන්ට අවහිර වීම

### අවිස්සාවේල්ල දිස්ත්‍රික්කය—සබරගමු කොට්ඨාශය

### කොළඹ-අවිස්සාවේල්ල-ගිනිගත්හේන පාරේ අංක 38/2 පාලම ප්‍රතිසංස්කරණය

ඉහත සඳහන් පාරේ පාලමේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා 62.1.9 සිට නැවත දන්වන තුරු සියළු රථ වාහනයන්ට වසා ඇති බැව් මෙයින් නිවේදනය කරමි.

ඒ වෙනුවට ඇහැළියගොඩ-දෙහිඕවිට හරහා මාර්ගය පාවිච්චි කළ හැකිය.

මෙල්සන් ප්‍රනාන්දු,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

රජයේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ, 62.8.10.

8-865

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුද පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.

ලංකාවේ වැලවත්තෙයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණයකි